
# කාර්ය පත්‍රිකාව 3.1

## භාග



**උපදෙස්**

♣




a) අඳුරු කල කොටස මුළු ප්‍රමාණයෙන් කොපමණ භාගයක්ද ? .............

b) ඉතිරි කොටස මුළු ප්‍රමාණයෙන් කොපමණ භාගයක්ද ? ............

♣ රුපියල් 500ක් රැගෙන පොළට ගිය අම්මා එම මුදලෙන් එළවළු ගැනීම සඳහා රුපියල් 300ක් ද පලතුරු මිලදී ගැනීම සඳහා රුපියල් 150ක් ද වැය කලා ය.

a) මුදලෙන් කවර භාගයක් එළවළු ගැනීමට වියදම් කර තිබේ ද ? ...................

b) මුදලෙන් කවර භාගයක් පලතුරු ගැනීමට වියදම් කර තිබේ ද ? ...................




♣ සුළු කරන්න

a) $\frac{1}{5} + \frac{2}{5}$

b) $\frac{1}{2} + \frac{4}{5}$


c) $\frac{2}{5} \div \frac{1}{2}$ න් $\frac{4}{5}$

d) $(\frac{4}{5} + \frac{2}{3})$ න් $\frac{1}{2}$


## කාර්ය පත්‍රිකාව 3.2

# භාග

***උදාහරණය :*** අමාලි සතුව ඉඩමකින් $\frac{1}{6}$ ක් ඇත.




අමාලිට අයිති නොමැති ඉඩම් ප්‍රමාණයෙන් $\frac{2}{5}$ ක් ඇය නැවත මිලට ගන්නා ලදි. අලුතින් මිලට ගන්නා ලද ඉඩම් ප්‍රමාණය පහත රූපයේ අඳුරු කර ඇත.







## උපදෙස්

♣

i.සුනිල් මහතාගේ මාසික වැටුපෙන් $\frac{3}{8}$ ක් ආහාර සඳහා වැය කරයි. සුනිල් මහතාගේ වැටුප කොටස් 8කට වෙන් කර පහත රූපයේ දැක්වේ. ආහාර සඳහා සුනිල් මහතා වැය කරන ප්‍රමාණය පහත දැක්වෙන රූපයේ අඳුරු කර දක්වන්න.




ii. ආහාර සඳහා වියදම් කල පසු වැටුපෙන් කවර භාගයක් ඉතුරු වේද ? ................

iii. එම ඉතිරි ප්‍රමාණයෙන් $\frac{1}{5}$ ක් ගමන් වියදම් සඳහා වැය කරයිනම් ගමන් වියදම් සඳහා වැය කරන ප්‍රමාණය ඉහත රූපයේ වෙනත් වර්ණයකින් අඳුරු කර දක්වන්න

♣

i. සම්පූර්ණයෙන් ජලය පිරී ඇති ටැංකියකින් $\frac{2}{5}$ ක් ප්‍රයෝජනයට ගන්නා ලදි. ප්‍රයෝජනයට ගන්නා ලද ජලය ප්‍රමාණය පහත රූපයේ අඳුරු කරන්න



ii. ටැංකියේ ඉතිරි ජල ප්‍රමාණය මුළු ටැංකියෙන් කවර භාගයක් ද ? ..............

iii. එම ඉතිරි ජල ප්‍රමාණයෙන් $\frac{1}{3}$ ක් නැවත භාවිතයට ගන්නා ලදි. එම නැවත භාවිතයට ගත් ජල ප්‍රමාණය ඉහත රූපයේ වෙනත් වර්ණයකින් අඳුරු කර දක්වන්න